# වයඹ පළාතේ 1994 අංක 02 දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය

(වයඹ ආණ්ඩුකාරවරයා අනුමතිය දුන් දිනය : 1994.12.16 )

1990 අංක 8 දරන වයඹ පළාතේ මුදල් ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා වූ ප්‍රඥප්තියකි.

වයඹ පළාතේ පළාත් සභාව විසින් මෙසේ සම්මත කරනු ලැබේ :-

**ලුහුඬු නාමය.**

1. මේ ප්‍රඥප්තිය වයඹ පළාතේ 1994 අංක 02 දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය ලෙස හඳුන්වනු ලැබේ.

   මෙම ප්‍රඥප්තියට ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබීමෙන් පසු එය ක්‍රියාත්මක වේ.

**ප්‍රධාන ප්‍රඥප්තියේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම.**

2. 1990 අංක 8 දරන වයඹ පළාතේ මුදල් ප්‍රඥප්තියේ දීර්ඝ නාමය, එහි " මුද්දර ගාස්තු පනතේ ඇතැම් විධිවිධාන වලට අනුකූල වේ" යන වචන ඉවත් කොට, ඒ වෙනුවට, " මුද්දර ගාස්තු පනතේ සහ සංශෝධිත පරිදි වූ සුරාබදු ආඥාපනතේ සහ සංශෝධිත වූ පරිදි මහ නගර සභා ආඥාපනතේ සහ සංශෝධිත පරිදි වූ නගර සභා ආඥාපනතේ සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ ඇතැම් විධිවිධාන වලට අනුකූල වේ" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය සංශෝධනය කිරීම.**

3. 1990 අංක 8 දරන වයඹ පළාතේ මුදල් ප්‍රඥප්තියේ 34 වන වගන්තියේ (ඊ) උප වගන්තියට ඉක්බිතිවම එන ඡේදයේ "රුපියල්" යන වචනයට ඉක්බිතිවම එන " පනස් දහසක්" යන වචන ඉවත් කොට, ඒ වෙනුවට " පන් දහසක්" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**අනනුකූලතාවක් ඇති වූ විට සිංහල පාඨය බලපැවැත්විය යුතු බව.**

4. මේ ප්‍රඥප්තියේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවූ විටක, සිංහල භාෂා පාඨය බල පවත්වන්නේ ය.